# ඉන්දියාවේ විසිතුරු මල් අලෙවිකරණය හා අපනයනය

Export Potential and Marketing of Flowers in India (M.S. Jadhav, P.P. Inamdar and B.V. Pagire - Indian Journal of Agricultural Marketing Vol. 14 - Sep-Dec. 2000)

සහ

Marketing of Marigold, Rose and Jasmine in Uttar Pradesh (Rakesh Kumar, A.R. Reddy and C. Sen - Indian Journal of Agricultural Marketing Vol. 18 - January - April 2004) යන පර්යේෂණ ග්‍රන්ථ ඇසුරෙන් සකස් කරන ලදී.

නිෂ්කලංක සුන්දරත්වයේ ද, ආදරයේ ද සංකේතයක් බඳු වූ විසිතුරු මල්, සෞන්දර්යාත්මක වටිනාකමකින් යුක්ත වේ. තව ද, මිනිස් සිත් සංසුන් කරන්නා වූත්, මිනිස් දිවියේ විවිධ වටිනා සන්ධිස්ථානයන්හිදීත්, සාමූහිකව එක් රැස්වීම් වලදීත්, වටිනාකම තීව්‍ර කරන්නා වූත් හැකියාවකින් යුක්ත වූවකි. විවිධ උත්සව අවස්ථා, විවාහ මංගල්‍ය අවස්ථා මෙන්ම අවමංගල කටයුතු වලදීත්, මල් මිනිසුන්ගේ ජීවිතය හා බැඳී පවතී. සෞන්දර්යාත්මක අංශයෙන් පමණක්ම නොව විවිධ සුවඳ විලවුන් සැකසීමේදීත්, විවිධ කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍යය ක් (තෙල්) වශයෙන් ද, විවිධාකාර වූ විසිතුරු මල් භාවිතා කරනු ලබයි.

මෙම විසිතුරු මල් සඳහා බටහිර රටවල හා ගල්ෆ් රටවල් වලින් ඉතා ඉහළ ඉල්ලුමක් පවතින බව වාර්තා වේ. මේ අනුව, විසිතුරු මල් අපනයනය සඳහා සාර්ථක වෙළඳපොළක් පවතින අතර ඒ තුළින් රටකට විදේශ විනිමය උපයා ගැනීමේ හැකියාව පවතී. ඉන්දියාවේ කෘෂි නිෂ්පාදන අපනයන සංවර්ධන අධිකාරිය (Agricultural Produce Export Development Authority - APEDA) විසින් සිදු කරන ලද අධ්‍යයනයකට අනුව, ඉන්දියාවේ හෙක්ටයාර් 30,000 ආසන්න භූමි ප්‍රමාණයක් මෙම විසිතුරු මල් වගාව සඳහා වෙන් කොට තිබේ. මල් වගාව සඳහා වෙන් වී ඇති මුළු භූමි ප්‍රමාණයෙන් වැඩිම භූමි ප්‍රමාණයක් කර්නාටක ප්‍රදේශයෙන් (29.65%) වාර්තා වන අතර තමිල්නාඩු ප්‍රදේශයේ එය 28.16% ක් වශයෙන් වේ. මහාරාෂ්ඨවල 6.87% ක් වශයෙන් ද, මේ භූමි ප්‍රමාණය විසිරී පවතී. ඉන්දියාවේ මුළු මල් නිෂ්පාදනයෙන් 6.90% ක ප්‍රමාණයක් සැපයෙන්නේ මහාරාෂ්ඨ ප්‍රදේශයෙනි.

ඉන්දියාවේ දේශීය වෙළඳපොළ උදෙසා බහුලව වගා කරන මල් වර්ග කිහිපයකි. මැරිගෝල්ඩ් (දාස්පෙතියා වර්ගයකි), ඇස්ටර් (ඩේසි වර්ගයකි), රෝස හා කියුබ් රෝස, ග්ලැඩිලස් (අයිරිෂ් ඝනයට අයත් මල් වර්ගයකි), කපුරු සහ පිච්ච යන මල් වර්ග ඒ අතර ප්‍රධාන වේ. මේ වන විට, හෙක්ටයාර් 100,000 ආසන්න භූමි ප්‍රමාණයක් වාණිජ වශයෙන් දේශීය වෙළඳපොළ සඳහා අවශ්‍ය මල් වර්ග නිෂ්පාදනය සඳහා වෙන් කොට ඇති අතර හෙක්ටයාර් 160 ක පමණ භූමි ප්‍රමාණයක් හරිතාගාර යටතේ (Green House) වගා කර ඒවා මූලික වශයෙන් අපනයනය සඳහා යොමු කෙරේ.

කර්නාටක ප්‍රදේශය අපනයනාභිමුඛ මල් වගාව සඳහා වැඩිම භූමි ප්‍රමාණයක් යොදවා ඇති අතර (28.60%) එය වැඩිම තිමැවුමක් (37.84%) ලබා දෙන ප්‍රදේශය වශයෙන් ද සැලකේ. බටහිර බෙංගාලය 23.66% ක භූමි ප්‍රමාණයක් මේ මල් වගාව සඳහා යොදවා ඇති අතර තමිල්නාඩු ප්‍රදේශයෙන් මුළු මල් නිෂ්පාදනයෙන් 26.54% (1993-1994) ක ප්‍රමාණයක් ලැබී තිබුණි. 1994-1995 දක්වා කාලය තුළ මල් වගාව හා නිෂ්පාදන ප්‍රමාණය සුළු වශයෙන් අඩු වීමක් පෙන්නුම් කරන අතර එම කාලපරිච්ඡේදය තුළ වැඩිම භූමි ප්‍රමාණයක් වගා කොට තිබුණේ ආන්ද්‍රා ප්‍රදේශයේය.

ඉන්දියාවේ මල් අපනයනය සම්බන්ධයෙන් සලකා බැලූ විට, වැඩිම ප්‍රමාණයක් අපනයනය කෙරෙන්නේ ඇමරිකා එක්සත් ජනපදයට වන අතර එය 1992-1993 කාලය තුළ මුළු අපනයන ප්‍රමාණයෙන් 25.37% ක් පමණ විය. ජර්මනිය දෙවන ස්ථානයට වැදගත්කමක් උසුලන අතර ජර්මනිය සඳහා මුළු අපනයන ප්‍රමාණයෙන් 10.8% ක ප්‍රමාණයක් අපනයනය කරනු ලබයි. 1997-1998 කාල පරිච්ඡේදය වන විට, මේ තත්ත්වය මදක් වෙනස් ස්වරූපයක් උසුලා ඇති අතර එම කාලය තුළ

**රෝෂිණී රඹුක්වැල්ල**
*පර්යේෂණ නිළධාරිණී,*
අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය,
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

ප්‍රධාන වශයෙන් අපනයනය කෙරෙන රට බවට පත්ව ඇත්තේ ජපානයයි. මුළු අපනයන වටිනාකමින් 38.85% ක ප්‍රමාණයක් ජපානයට හිමි ව තිබේ. නෙදර්ලන්තයට එම කාලය තුළ මුළු අපනයන වටිනාකමින් 28.49% ප්‍රමාණයක් අපනයනය කර ඇති අතර ජපානය, නෙදර්ලන්තය, බ්‍රිතාන්‍යය, ඕස්ට්‍රේලියාව හා හොංකොං වැනි රට වලට කෙරෙන විසිතුරු මල් අපනයනයන් හි වර්ධනයක් දක්නට ලැබේ.

1992 සිට 1998 දක්වා වූ අවුරුදු 06 ක කාලය තුළ මල් සඳහා විදේශ රට වලින් පැවති ඉල්ලුම විශාල වශයෙන් වර්ධනය වී තිබේ.

**ඉන්දියාවේ මල් අපනයන වටිනාකම්**
**(1992-1993, 1997-1998) (රුපියල් ලක්ෂ)**

| රට | 1992-1993 | 1997-1998 |
|---|---|---|
| ඕස්ට්‍රේලියාව | 4.69 | 68.72 |
| බහරේන් | 2.46 | 4.88 |
| ප්‍රංශය | 3.43 | 32.66 |
| ජර්මනිය | 11.36 | 99.63 |
| හොංකොං | 0.42 | 6.11 |
| ඉතාලිය | 8.76 | 16.94 |
| නෙදර්ලන්තය | 4.04 | 491.74 |
| ජපානය | 3.23 | 670.56 |
| ඕමානය | 6.13 | 0.59 |
| පාකිස්ථානය | 2.03 | 6.18 |
| රුසියාව | 3.68 | 1.10 |
| සෞදි අරාබිය | 9.97 | 7.14 |
| ශ්‍රී ලංකාව | 1.93 | 3.91 |
| ස්විට්සර්ලන්තය | 2.15 | 26.04 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 8.40 | 59.42 |
| බ්‍රිතාන්‍ය | 3.17 | 97.15 |
| ඇමරිකා එක්සත් ජනපදය | 26.46 | 127.83 |

ඉන්දියාවෙන් අපනයනය කරනු ලබන විසිතුරු මල් යටතේ විවිධ ප්‍රභේදයන් පවතී. කැපූ විසිතුරු මල් වලට අමතරව වියැළුනු මල් වර්ග ද, විසිතුරු පැල හා පත්‍ර වර්ග ද, වියළි විසිතුරු පත්‍ර වර්ග ද, බල්බ ද ඒ අතර පවතී. 1992-1993 හා 1997-1998 දක්වා කාලය තුළ ඉන්දියාවෙන් අපනයනය කරන ලද එම විවිධ ප්‍රභේදයන් පහත පරිදි දැක්විය හැකිය.

**ඉන්දියාවේ අපනයනිත මල් සහ**
**ප්‍රභේදයන්ගේ වටිනාකම් (රුපියල් ලක්ෂ)**

| වර්ග | 1992 - 1993 | 1997 - 1998 |
|---|---|---|
| කැපූ මල් | 108.99 | 1894.12 |
| වියළි මල් | 735.38 | 5327.30 |
| විසිතුරු පැල හා පත්‍ර | 305.66 | 671.20 |
| වියළි පත්‍ර (විසිතුරු) | 262.32 | 483.54 |
| බල්බ | 78.34 | 298.08 |

මූලාශ්‍රය : **Indian Journal of Agriculture Marketing**

ඉන්දියාවේ විසිතුරු මල් අලෙවිකරණය සම්බන්ධයෙන් සලකා බලන විට, විවිධ අලෙවිකරණ මාර්ග කිහිපයක් හඳුනා ගැනීමේ හැකියාව ලැබේ.

i. නිෂ්පාදකයා → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා
ii. නිෂ්පාදකයා → තොග වෙළෙන්දා → සිල්ලර වෙළෙන්දා පාරිභෝගිකයා
iii. නිෂ්පාදකයා → අතරමැදියා → තොග වෙළෙන්දා → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා

අලෙවිකරණ වියදම සම්බන්ධයෙන් ගත් විට රෝස මල් සඳහා අලෙවිකරණ වියදම ඉහත සඳහන් අලෙවිකරණ මාර්ග තුළ පිළිවෙලින් රු.6.27, රු.6.68 (දුසිමක් සඳහා) ක් වශයෙන් පවතී. මේ අලෙවිකරණ මාර්ග තුළ දී වැඩිම පිරිවැයක් දැරීමට සිදුවන්නේ ප්‍රවාහන කටයුතු සඳහාය. මේ තත්ත්වය රෝස, ග්ලැඩිලස්, මල් වර්ග සඳහා ප්‍රධාන වශයෙන් දැකිය හැකි වන අතර ඇස්ටර් වර්ගයේ මල් සඳහා සිල්ලර වෙළෙඳුන්ගේ වියදම Retailer's Expenses කැපී පෙනෙයි.

මිල පැතිරයාම සම්බන්ධව සලකා බැලීමේ දී, නිෂ්පාදකයන්ට හිමි කොටස, වඩා වැඩි අගයක් පෙන්නුම් කරන්නේ ඉහත දක්වා ඇති පළමුවෙනි අලෙවිකරණ මාර්ගයේදී ය. මෙහි දී, අතරමැදියන් අවම මට්ටමක පවතී. මේ අධ්‍යයනය තුළින් පැහැදිලි වන කරුණක් නම් අලෙවිකරණ ක්‍රියාවලිය සඳහා මැදිහත් වන අතරමැදියන්ගේ සංඛ්‍යාව වැඩි වීමත් සමඟ පාරිභෝගිකයා විසින් ගෙවනු ලබන මිලෙහි නිෂ්පාදකයාගේ කොටස අඩුවීමක් පෙන්නුම් කිරීමයි. කෙසේ වුව ද, විවිධ වර්ගයේ මල් සඳහා මෙය වෙනස් ස්වරූපයක් උසලනු ලබයි.

මල්වල පවතින ඉක්මණින් විනාශ වීමේ ස්වභාවය නිසා අලෙවිකරණයේ දී ඒවායේ ගුණාත්මක තත්ත්වය ආරක්ෂා කෙරෙන අයුරින් කටයුතු කිරීම සිදුකළ යුතුය. උත්තර ප්‍රදේශය ප්‍රධාන වශයෙන් මල් වගා කරන ප්‍රදේශයක් වන අතර හෙක්ටයාර් 6320 ප්‍රමාණයක් මල් වගාව සඳහා වෙන් ව පවතී. මේ ප්‍රදේශයේ කැපූ මල් (Cut Flowers) ලක්ෂ 3400 ක් පමණ වාර්ෂිකව නිපදවන අතර කපා සකස් නොකළ මල් (Loose Flowers) ටොන් 5600 ක් පමණ වාර්ෂිකව නිපදවනු ලබයි. වරණාසි උත්තර ප්‍රදේශයේ ප්‍රධාන මල් වගා කරන දිස්ත්‍රික්කයක් වන අතර මැරිගෝල්ඩ්, රෝස සහ පිච්ච මල් මේ ප්‍රදේශයේ මල් වගා කරන්නන් (නිෂ්පාදකයන්) තම නිෂ්පාදන කෙලින්ම සිල්ලර වෙළෙන්දාට අලෙවි කිරීමක් දක්නට ලැබෙයි. සිල්ලර වෙළෙඳුන් විසින් ඒවා පාරිභෝගිකයන් වෙත අලෙවිකරන අතර අලෙවිකරණ මාර්ගය ඉතාමත් කෙටි එකක් වශයෙන් හැඳින්විය හැකි වේ.

අලෙවිකරණ පිරිවැය සම්බන්ධයෙන් ගත් කළ රෝස මල් සඳහා ඉහළම පිරිවැයක් දක්නට ලැබෙන අතර වෙළඳපොළේ ඉහළම මිලක් රෝස සඳහා හිමි වේ. සැකසීමේ පිරිවැය (Processing Cost) මල් අලෙවිකරණ ක්‍රියාවලියේ දී ප්‍රධාන පිරිවැයක් වන අතර බොහොමයක් නිෂ්පාදකයන් විසින් සිල්ලර වෙළෙඳුන්ට මල් අලෙවි කරනු ලබන්නේ මල් මාලා (Garlands) වශයෙන් සැකසීමෙන් අනතුරුවය. ඒ අනුව,

සැකසීමේ පිරිවැය වශයෙන් මැරිගෝල්ඩ් සඳහා කිලෝ ග්‍රෑමයකට ශත 60 ක්ද, රෝස සඳහා ශත 75 ක්ද, පිච්ච සඳහා ශත 42 ක් වශයෙන් ද වැය වෙයි.

මල් වගා කරන්නන් (නිෂ්පාදකයන්) වෙළඳපොළ සඳහා මල් අලෙවි කිරීමේ දී ඇසුරුම් උපකරණයක් ලෙස බහුලව භාවිතා කරනු ලබන්නේ උණ පතුරු වලින් සකස් කරගන්නා ලද කූඩය (බහලුමක්) කි. දේශීය වශයෙන් එය සපයා ගැනීම ඉතා පහසු බැවින් බොහොමයක් නිෂ්පාදකයන් එය බහුලව භාවිතා කරනු ලබයි. ඊට අමතරව රෙදි වලින් සකසා ගත් මළු, ගෝනි මළු සහ පොලිතින් උර ද, ඒ සඳහා භාවිතා කරයි. උත්තර ප්‍රදේශයේ බහුලව භාවිතා කරන ප්‍රවාහන මාධ්‍ය වන්නේ බයිසිකලයයි. ප්‍රවාහන මාධ්‍යයක් වශයෙන් වෙනත් විකල්ප අවම වීමත්, බොහොමයක් නිෂ්පාදකයන් කුඩා පරිමාණයේ අය වීමත්, නිෂ්පාදන ප්‍රදේශයේ සිට වෙළඳපොළට පවතින දුර ප්‍රමාණය අඩු වීමත් යන කරුණු නිසා බොහෝ නිෂ්පාදකයන් තම නිෂ්පාදන වෙළඳපොළට ප්‍රවාහනය කිරීමේ ප්‍රධාන මාධ්‍යය වශයෙන් බයිසිකලය යොදා ගනු ලබයි.

ඉන්දියාවේ විසිතුරු මල් අලෙවිකරණය සම්බන්ධව පවතින ප්‍රධාන ගැටළුව වශයෙන් මිල උච්චාවචනය සැලකිය හැකිය. උත්තර ප්‍රදේශයේ කරන ලද අධ්‍යයනයකට අනුව, මල් වගා කරන නිෂ්පාදකයන්ගෙන් 79% කට ආසන්න ප්‍රමාණයක් තම ප්‍රධාන ගැටළුව වශයෙන් පෙන්වා දී ඇත්තේ මේ මිල උච්චාවචනයයි. මල්වල පවතින ඉක්මණින් විනාශ වීමේ ස්වභාවය මේ මිල උච්චාවචනය සඳහා ප්‍රධාන වශයෙන් බල පැවැත් වේ. ප්‍රමාණවත් නොවන ප්‍රවාහන පහසුකම්, විසිතුරු මල් අලෙවිකරණයේ දී නිෂ්පාදකයන් මුහුණ දෙන ගැටළුවකි. මල්වල ස්වභාවය අනුව ප්‍රවාහනය, අලෙවිකරණය සම්බන්ධයෙන් ඉතා විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මල් වෙළඳපොළට ළඟාවීමේ දී තැලීම් පොඩිවීම් වලට ලක් නොවී අළුත් ස්වභාවයෙන් පවතී නම් ඒ සඳහා ඉහල මිලක් ලබා ගැනීමේ හැකියාව පවතී. ආයතනික වශයෙන් විධිමත් ලෙස ණය ලබාගැනීමට ඇති හැකියාව අඩු මට්ටමක පැවතීම ද ප්‍රධාන ගැටළුවකි. වෙළඳපොළට පහසුවෙන් ළඟා විය හැකි පරිදි දියුණු මාර්ග පද්ධතියක් නොමැතිවීම ද විසිතුරු මල් අලෙවිකරණයේ දී නිෂ්පාදකයන් මුහුණදෙන ගැටළුවකි.

කෙසේ වුවත්, ඉන්දියාවේ විසිතුරු මල් වර්ග සම්බන්ධයෙන් දිනෙන් දින වර්ධනය වන දේශීය ඉල්ලුමක් මෙන්ම විදේශීය ඉල්ලුමක් ද පවතින අතර මෙම ඉල්ලුම සපුරාලීම සඳහාත්, මල් අපනයන ක්ෂේත්‍රය දියුණු කිරීම තුළින් ඉහළ විදේශ විනිමයක් උපයා ගැනීම සඳහාත් ඉන්දියාව කටයුතු සම්පාදනය කරමින් සිටී.

## උද්‍යාන බෝග වගාවේ දී භාවිතයට ගැනෙන ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ආහාර බෝග වර්ග කිහිපයක්

| **ශාකය** | **උද්භිද විද්‍යා නාමය** | **ඉංග්‍රීසි හැඳින්වීම** |
|---|---|---|
| අඹ | *Mangifera indica* | Mango |
| නෙල්ලි | *Phyllanthus emblica* | Emblic Myrobalan tree Indian gooseberry |
| ඇඹරැල්ලා | *Spondias pinnata* | Bile tree/Indian hog plum Traveller's delight/ wild mango |
| කටුලොවි | *Flacourtia ramontchi* | Sapida, Governer's plum Ramohtch |
| මාදං | *Syzygium cumini* | Black plum, Jambolan, Java plum |
| මැංගුස්ටින් | *Garcinia mangostana* | Mangosteen |
| නම්නම් | *Cynometra cauliflora* | Num - num |
| රඹුටන් | *Nephelium lappaceum* | Rambutan/Hairy Litchi |
| සැපදිල්ලා | *Manilkara zapota* | sapodilla sapot Neseberry |
| සියඹලා | *Tamarindus indica* | Tamarind |

(පොත - පත ඇසුරෙනි)